Welcome

# LakRuhuna

Get more to your Life….

Welcome

# LakRuhuna

PANSALA E - PUDLISHING

LAKRUHUNA

ආයුබෝවන්...

# ලක්රුහුණ

විද්‍යුත් මාධ්‍ය ප්‍රකාශණ

LAKRUHUNA

චතුරාර්ය සත්‍යාවබෝධයට ධර්ම දේශනා....

# සිත සනසන අමාගඟුල

වැලිගම ශ්‍රී සුගත ශාන්ති සේවා සංසදයේ ගරු යාවජීව සභාපති

## ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා

විසින් පවත්වන ලද වැඩසටහන් වලදී දේශනා කරන ලද සූත්‍ර දේශනා ඇසුරෙනි.

පරිගණක අකුරු සැකසුම

පිටකවර නිර්මාණය ඃ

ප්‍රකාශනය ඃ ලක්රුහුණ.com

මුද්‍රණය ඃ

සිත සනසන අමාගඟුල

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!

නුවණට අධිපති දෙවියන් වැඳීම නුවණ ලැබීමට හේතුවකි.

*සංයුත්ත නිකාය අනාථ පිණ්ඩික සූත්‍රය*

**සිත සනසන අමාගගුල**

අද ඉල්පුර පසළොස්වක පොහොය දිනයයි. මෙවර කඨින පූජා පිංකම කළ හැකි අන්තිම දිනය වීමද, පසුවස් පවාරණය කරන දිනය වීමද මෙත්බෝසතුන් විවරණ ලැබීමද, තුන්බෑ ජටිල දමනය මහා ප්‍රාඥ අග්‍රශ්‍රාවක සැරියුත් මහරහතන් වහන්සේගේ පිරිණිවීම යන වැදගත් ශාසනික කරුණු රාශියක් සිහිපත් කරන දිනයයි.

බුදුරජාණන් වහන්සේ ජේතවන විහාරයෙහි වැඩවසන දිනක රාත්‍රිය ඉක්මගිය පසු භික්ෂූන්වහන්සේලා ඇමතූසේක. "මහණෙනි, මේ රාත්‍රියෙහි මනා පැහැයෙන් යුත් එක්තරා දේවතාවෙක් පෙරයම ඉක්ම වූ කල මුළු දෙව්රම බබුලුවා මාවෙත එළඹ එකත් පසෙක සිට මේ ගාථා කීය. යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේවතාවා කී ගාථා සතරක් වදාළහ. එම ගාථා සතරෙහි සරළ අදහස මෙසේය.

01. භික්ෂු සමූහයා විසින් නිරන්තරව හැසිරෙන ධර්මරාජයන් වූ බුදුරජාණන් වහන්සේ විසින් වාසයකරන මේ ප්‍රසිද්ධ ජේතවනය මට සතුට ඇතිකරන්නේය.

02. කර්මයද, විද්‍යාවද, ධර්මයද උතුම් සිල්වත් ජීවිතයද යන මෙයින් සත්වයෝ පිරිසිදු වෙති. කුලයෙන් හෝ ධනයෙන් සත්වයෝ පිරිසිදු නොවෙති.

03. එබැවින් නුවන ඇති පුරුෂයා තමාගේ අභිවෘද්ධිය දැක නුවණින් සමාධි පාක්ෂික ධර්ම වර්ධනය කරන්නේය. එසේ ඒ ආර්යමාර්ගයට පැමිණීමෙන් පිරිසිදු වෙයි.

04. ප්‍රඥාවෙන් ශීලයෙන් සහ කෙලෙස් සංසිඳීමෙන් නිවනට පැමිණි යම් මහණෙක් වේනම් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේම උත්තමය උන්වහන්සේට වඩා විශිෂ්ඨයෙක් නැත.

මෙසේ වදාළ කල්හි ආනන්ද ස්ථවිරයන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේට වැඳ "භාග්‍යවතුන් වහන්ස ! ඒ දේවතාවා ඒකාන්තයෙන්ම අනාථපිණ්ඩික දේවතාවා ද? අනේපිඬු සිටුතුමා ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ කෙරෙහි මිනිස්ව සිටියදී බෙහෙවින්ම පැහැදුනේ වී"යයි පැවසීය.

"ආනන්ද යහපති ! යහපති !! යම් තරමක් තර්කයෙන් දතයුතුනම් තොප දන්නාලදී. ආනන්ද ! හෙතෙමේ අනාථ පිණ්ඩික දෙව්පුතුමය"යි බුදුරජාණන් වහන්සේ වදාළහ.

පළමු ගාථාවෙන් දේවතාවා ඉතා සතුටින් ජේතවනාරාමය පිළිබඳව වර්ණනාවක් සිදුකරනව. අනාථ පිණ්ඩික දිව්‍යපුත්‍රයා එහි තිබෙන සුව පහසු දිව්‍ය සම්පත් දැක මිනිස් ලොව පිළිබඳව ආවර්ජනා කර බැලූ කල ත්‍රිවිධරත්නය ඇසුරුකරමින් නොයෙක් පිංදහම් කොට සෝවාන් ඵල ලාභීව

තුසිත දෙව්ලොව උපන්බව තේරුම්ගෙන දිව්‍ය සම්පත් විඳීමට පළමුව දෙව්රම් වෙහෙරට යන්නෙමියි සිතා ඒහි පැමිණ

"ඉදං හිතං ජේතවනං ඉසි සංඝ නිසේ විතං" යනාදී ගාථාව ප්‍රකාශකරමින් සිය සතුට ප්‍රකාශකරන දේවතාවා ඊලඟ ගාථාවෙන්

කර්‍මයද විද්‍යාව හෙවත් දැනුමද සමාධියට හිතකරවූ ධර්‍මයද සිල්වත් ජීවිතයද උතුම්ය. ඒකී කර්මාදිය හේතු කොටගෙන සත්වයෝ පිරිසිදු බවට පත්වන බවද කුල ගෝත්‍රයෙන් ධනයෙන් පිරිසිදු නොවෙනබවත් ප්‍රකාශකලේය. තුන්වෙනි ගාථාවෙන් නුවණැති පුද්ගලයා තමාගේ අභිවෘද්ධිය නුවණින් දැක සමාධි පාක්ෂික ධර්‍ම දියුණුකර ආර්‍ය මාර්‍ගය හේතුකරගෙන පිරිසිදු වන බව ප්‍රකාශ කළේය.

අනාථපිණ්ඩික දේවතාවාගේ සිතතුල තෙරපුණු ඊලගෙ අදහසවූයේ සතරවෙනි ගාථාවෙන් ප්‍රකාශ වූ අදහසයි. ඒනම් ශාරිපුත්ත මහරහතන් වහන්සේගේ උත්තම ගුණ සමුදාය පිළිබඳ ප්‍රකාශයයි. පළමු ගාථා තුනෙන් ඒ සඳහා ප්‍රවේශයක් ඇතිකරගත් පිං ඇති දේවතාවා උන්වහන්සේ පිළිබඳ විශේෂත්වයක් දකිති.

කම්මං විජ්ජාච ධම්මෝච සීලං ජීවිත මුත්තමං ...

යනුවෙන් සත්වයෙකුගේ පිරිසිදු භාවය ඇතිවීමට කර්‍මය ඒක් අංගයක්ලෙස සිටුවරයෙක් වශයෙන් මිනිස්ලොව සිටියදී සැරියුත්

**සිත සනසන අමාගඟුල**

මහරහතන් වහන්සේගේ ජීවිතය තුලින්ම අවබෝධ කරගත් සෙයක් පෙනේ. කර්මය යනු යම් සත්වයෙක් කරන ක්‍රියාවෝය. යහපත් අයහපත් ක්‍රියාවන් සිදු කරන කල ඒ ඒ කර්මයන්ට අනුව ජීවිතයේ පිරිසිදු අපිරිසිදු භාවය ඇතිවේ. සාමාන්‍ය මනුෂ්‍යයෙකු වශයෙන් ජීවිතයෙන් යහපත් කර්මයන් සිදුකරමින්

මාර්ගචේතනා සංඛ්‍යාත කර්මයන් දක්වා ගමන් කිරීම තුලින් පුද්ගල පිරිසිදුතාවය දක්වා ගමන්කල හැකිය.

මීලඟ හේතුව හැටියට "විජ්ජාච" යනුවෙන් යම් සත්වයෙක් පුද්ගලයෙක් ලඟ දැනීමක් බුද්ධියක් තිබිය යුතුය. ඒ බව අනේපිඩු සිටුතුමා මරණාසන්න වූ අවස්ථාවේදී ගිලන් ඇඳලගදී සැරියුත් හාමුදුරුවෝ එතුමාට පැහැදිලි කළ ධර්මය හොඳට මතක තිබින. "ගෘහපතිය ඇස, කණ, නාසය, දිව, ශරීරය, මනස යන ආයතන නිසා ඇති වන්නා වූ විඤ්ඤාණයන් තණ්හා, දිට්ඨි, මාන වශයෙන් නොගත යුතුයයි ද එයින් හික්මිය යුතුයයි ද අනාථ පිණ්ඩිකෝවාද සූත්‍රයට අනුව ප්‍රකටවේ.

මීලඟ කාරණය වන "ධම්මෝ"ච යන පදයෙන් සමාධියට හිතකර ධර්මයන් වශයෙන් තණ්හා, දිට්ඨි, මාන වශයෙන් එන එන අරමුණු එලෙසින් නොගෙන ඒවා දෙස ධර්මානුකූලව බලා සිත හික්මවාගැනීම සාමාන්‍ය මනුෂ්‍යයා විසින් කලයුතුය. එවිට ජීවිත ගැටුම් අඩුවේ. වත්මන් සමාජයතුල මේ දුර්වලතාවය බොහෝසෙයින් ඇතිවන වටපිටාව සහ සාධක බොහෝය.

## සිත සනසන අමාගඟුල

අද කුඩාකල පටන් අප රටේ දරුවන්ට හිමිවන්නේ සිත හා ගැටෙන අරමුණු පාලනය කරගැනීමට නොහැකි පසුබිමකි. ඇතැම් රූපවාහිනී නාලිකා තුලින් පෙන්වන වැඩසටහන් තලු මර මර දරුවන් බලන විට වැඩිහිටියන්ට "තරු"පෙනී හමාරය. දැන් ඉතිරිව ඇත්තේ ඇගේ නූල් පටක්වත් නැතිව නටන නැටුමක් ඉදිරිපත් කිරීමේ මොහොත එළඹීම පමණි. මේ තුලින් සාමාන්‍ය මනුෂ්‍යයාගේ සිතට ආර්ය සමාධිය කෙසේවෙතත් සාමාන්‍ය සිතේ සන්සුන්කමක්වත් ඇතිකරගැනීම උගසටය. එයින් දූෂිත සමාජයක ලක්ෂණ පහලවීම නොවැලැක්විය හැකිය.

අනේපිඩු සිටුතුමාට බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ අනන සූත්‍රයෙහිදී "ගෘහපතිය කම්සැප විඳින්නා වූ ගිහියන් විසින් සුදුසුකාලයෙහිදී ලැබිය යුතු සැප හතරක් තිබේ. ඒ සැප හතර නම් දැහැමින් ලබාගත් ධනයද ඒ ලබාගත් තැනැත්තා සිය සම්පත් පරිභෝජනය කරමින් පින්දහම් සඳහා යෙදීමද ණය නොවී තිදොර නිවැරදිව පිහිටුවා ගැනීමයයි වදාළහ.

සීලය යම් පුද්ගලයෙකුට උතුම් ධර්මයකි. ඒ වග "සෝමේ අතථා අනුප්පත්තෝ කතං අනනුතාපියං" යනාදී වශයෙන් ආර්ය මාර්ග නාමයෙන් හඳුන්වන ලද පංච ශීලයෙහි පිහිටා එම ගුණ සිහිකෙරේනම්. ඔහු මෙලොවේදී නැනවතුන්ගේ පැසසුමට භාජනය වී පරලෝ වශයෙන්

**සිත සනසන අමාගඟුල**

සැනසුම විඳිමින් තුටුවන්නේය යි අනේපිඬු සිටානන් හට වදාළ පත්තකම්ම සූත්‍රයෙන්ද පැහැදිළි කළහ.

සතරවෙනි ගාථාවෙන් දේවතාවා සැරියුත් මහරහතන් වහන්සේ පිළිබඳව ගුණකථනයක් සිදුකරන්නේය.

"මහා පඤ්ඤානං යදිදං සාරිපුත්තෝ" යි සැරියුත් මහරහතන් වහන්සේ මහා ප්‍රඥාවන්තයයි. අග්‍රස්ථානයෙහි තබා වර්ණනා කළ සේක. උන්වහන්සේ පිරිනිවන් පෑමෙන් පසු ද තර්කයෙන් තොරව පිළිගත යුතු වන්නේ හේතු සහිතවය. හින්දු දහමේ ගණ දෙවියන් එම භක්තිවන්තයින්ට

උත්තමයෙකි. එම දහමට අනුව එම උත්තමභාවය ඔවුන් තේරුම් ගෙන ඇත. බෞද්ධයින් ඔවුන්ගේ නුවණට අනුව තම ශාස්තෘ වරුන්ගේ උත්තමභාවය හේතු සහිතව තේරුම් ගත යුතු බව බුදු හිමියන් වදාළහ. ප්‍රඥාව දියුණු කර ගැනීමට ජාතියක, ආගමක, කුලයක හෝ රටක බලපෑමක් නැත. බුදු රජාණන් වහන්සේ කිසිදු ආගමකට අයත් ශාස්තෘ වරයෙකු නොවේ. ලොව ඇති යථාර්ථය එළෙසින්ම කියා පෑ උත්තමයාය. උන් වහන්සේ ගැන සිතීමට පවා නුවණ දියුණු කර ගත යුතුය. ඇතැම් විට බුදුගුණ මෙනෙහි කිරීමට තරම්වත් වත්මන් ලෝකයේ ජීවත් වන අප සුදුස්සන් නොවන ස්වභාවයක් පෙනෙන අවස්ථා ද ඇත.

**සිත සනසන අමාගඟුල**

අප ඇතැම් බෞද්ධයින් හින්දු දහම විශ්වාසකරන හින්දුන් සිදු කරන චාරිත්‍ර විශාල මුදල් කන්දරාවක්ද වැය කොට ශිල්ප ශාස්ත්‍ර ආරම්භ කරන අවස්ථාවන් හිදී සිදු කරති. එම චාරිත්‍ර කෙතරම් දුරට ප්‍රඥාගෝචර දැයි

නුවණ මෙහෙයවා සිදු කරන්නේ නම් අප කොතරම් දුරට බුදු ගුණ සිහිමටද තරම් සුදුස්සෝ දැයි සිතෙනු ඇත.

එවැනි අවස්ථාවකදී ත්‍රිවිධ රත්නයට තමන් ලද පමණින් බුදුපුද පවත්වා සැරියුත් මහ රහතන් වහන්සේටද විශේෂ පූජාවන් පූජා කොට උන්වහන්සේලාගේ ප්‍රඥාපාරමිතාවේ ආනුභාවයෙන් තම දරුවාටද මතු වැඩි දියුණුව සඳහා නුවණ ලැබේවායි ප්‍රාර්ථනා කිරීම සුදුසුවෙයි.

මෙසේ සිදු කිරීමට කිසිදු බියක් සැකක් ඇතිකර නොගත යුතුය. හින්දු දහමේ ගණ දෙවියන් පිදීම කරණුයේ ඔවුන්ගේ දහමට අනුකූලවයි. බෞද්ධයා විසින් ප්‍රඥාවට අධිපති විශුද්ධියට පත් වූ දේවතාවෙකු ලෙස සැරියුත් මහ රහතන් වහන්සේට ගරු කළ යුතු බව බෞද්ධයාට තහවුරු කළේ උප්පැත්ති දේවතාවකු වූ අනාථපිණ්ඩික දේවතාවුන්ය. ඒ බුදු දහමට අනුවය. අප කිසි විටෙක බුදු දහමේ ඉගැන්වෙන පිළිවෙතට බිය විය යුතු නැත.

ලෝකයේ පහළවන යම් සත්වයෙක් වේ නම් එම සත්වයාගේ සසර ගමනටද පරම විශුද්ධිය වන එම ගමන නතර කිරීම හෙවත් නිවනට පත්වීමද සිදු වන්නේ තම තමන් විසින් සිදු කරන ක්‍රියාවන්ද ඇති කර ගන්නා දැනුමද

ඒ සඳහා නිවැරදි දැකීමක්ද හැසිරීමේ සීලාචාර බවද යන හේතූන් නිසා බව මෙම සූත්‍රයෙන් පැහැදිලි වෙයි. ඒ අනුව බුදු රජාණන් වහන්සේ ලොවට දායාද කල උන් වහන්සේගේ සතර පිරිස අතරින් සැරියුත් මහ රහතන් වහන්සේගේ පරම විශුද්ධි චරිතය ආදර්ශයට ගැනීම උන්වහන්සේගේ පිරිනිවීම ද සිහිපත් කරන අදවැනි දිනක උන්වහන්සේ පිළිබඳ මෙනෙහි කිරීමම අපගේ නුවණ දියුණු කිරීමට හේතුවන බැවින් උන්වහන්සේට ගෞරව කිරීමද වනබව තේරුම් ගනිමු.

යෝ පබ්බජී ජාති සතානි පඤ්ච - පහායකාමානි මනෝරමානි

තං වීතරාගං සුසමාහිතින්ද්‍රියං - පරිනිබ්බුතං වන්දථ සාරිපුත්තං

සාදු ! සාදු !! සාදු !!!